# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1905/37 – 2015 මාර්තු 13 වැනි සිකුරාදා – 2015.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම්පත්තු සුළු කොට්ඨාසයේ, එපාමුල්ල යන ගමේ පිහිටි ගම්පහ දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක Gam/Wat/2013/692 හා 2014.05.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1083 ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අංක 1 – වෙරළබඩ තල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1083 උතුරට: ඕ. එස්. ගුණවර්ධන සහ ඩී. සී. පී. ජයමහ හිමිකම් කියන වෙරළබඩ තල්ගහවත්ත; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුර හිමිකම් කියන වෙරළබඩ තල්ගහවත්ත; බටහිරට: මුහුද.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/4/2012/ඩී/593.
2014 අගෝස්තු මස 14 වැනි දින,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 860



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*